Number
in the list of Applicants

**MEDIA ACCREDITATION FORM (PROVINCIAL JOURNALIST-2020/2021)**

DEPARTMENT OF GOVERNMENT INFORMATION

**Please refer the guidelines and Gazette notification (12/12/2020-No.2205/17) before complete this.**

**1.**Name in full (Mr./Mrs./Miss)
**(In Block Letters/ Maintain word spacing )**

**2.** Preferred Name on Accreditation Card

**3.** National Identity Card No

**4.** Date of Birth: Year Month Date

**5.** Name of the Media Organization

**6.** Name of the Paper/TV/Radio

| TV | | Radio | | News paper | |
|---|---|---|---|---|---|

**7.**Job Title/Post

8. Covering i. District

ii. Area

Full Time ☐ Part Time ☐

9. What is the full time job ..........................................................................................

10. Previous Accreditation No Year

| Office Use Only: |
|---|
| ...................................................................................... |
| ...................................................................................... |
| ...................................................................................... |
| ................................................................................... |

← 1" →
1 ½"
Photo

Acc.Card No 2021/

11.Address (Office)

Telephone No

Fax No

l

12. Address (Residence)

Telephone No

Mobile No

Personal e-mail

**I hereby declare that the above details furnished by me are true and correct and I do further admit that in the event of any particulars found false or incorrect the Director General of Govt. Information has all the rights to withdraw or cancel the media accreditation card issued to me under his signature.**

…………………………… ….....................

Signature of Applicant Date

**Note:**

**Name and media institute of the media personal will be published on official website of the Department of Government Information www.dgi.gov.lk and Govt. news portal www.news.lk**

This Application Should accompany a letter of request from head of the organization

## For Office Use Only

………………………………………………………………………………………………………………

Recommended:……………………. Approved ……………………………………….

(DGI)

Department of Government Information. Press Accreditation Division, No.163, Kirulapona Road, Colombo

// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2205/17 - 2020 දෙසැම්බර් මස 12 වැනි සෙනසුරාදා - 2020.12.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

2021 වර්ෂය සඳහා නිල මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම

"සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව ජනමාධ්‍ය ආයතන හා එහි සේවයේ නියුතු වෘත්තීයවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම රජයේ වගකීම වේ. ඒ අනුව, යහපත් හා ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් වෙනුවෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට නිල ජනමාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනුයේ ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගුණාත්මක බව වර්ධනය කරමින් ඔවුන්ගේ වෘත්තීය ගරුත්වය ආරක්ෂා කිරීමටත්, ස්වකීය රාජකාරි කටයුතු බාධාවකින් තොරව ඉටුකිරීමත් සඳහාය.

ප්‍රවෘත්ති හා තොරතුරු රැස්කරන, එම තොරතුරු සංස්කරණය කරන, සපයාගත් තොරතුරු විද්‍යුත්, මුද්‍රිත හෝ වෙබ් මාධ්‍ය මගින් ග්‍රාහකයා/පාඨකයා වෙත සන්නිවේදනය කරනු ලබන තැනැත්තා ප්‍රවෘත්ති කලාවේදියකු/ජනමාධ්‍යවේදියකු වශයෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී සලකනු ලැබේ. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ එම කර්තව්‍යයේ යෙදෙන වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට පමණි.

මෙම හැඳුනුම්පත වෘත්තීය ජනමාධ්‍යවේදීන්ට පමණක් ලබාදීම සඳහා නිර්දේශ කිරීමට පියවර ගන්නා ලෙස සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන්ගෙන් සහ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු අංශ ප්‍රධානීන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

මාධ්‍ය හැඳුනුම්පත ලබාගැනීම සඳහා මාධ්‍ය ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන නාමලේඛනය හා එහි ඇතුළත් තොරතුරු පිළිබඳ පූර්ණ වගකීම එය සහතික කරන මාධ්‍ය ආයතන ප්‍රධානියා/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක හෝ අදාළ මාධ්‍ය ආයතනයේ බලධාරියා සතු වේ.

මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් ලිපි ලේඛන හා නිර්ණායක කෙරෙහි අදාළ පාර්ශ්වවල අවධානය යොමු කරවමි.

1A - G 33326 — 70 (2020/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මුද්‍රිත මාධ්‍ය

| | | | |
|---|---|---|---|
| 1. | ආයතනගත /මාණ්ඩලික මාධ්‍යවේදී | Journalist | - අංක 01 හා 02 |
| 2. | ඡායාරූප මාධ්‍යවේදී | Photo Journalist | - අංක 01 හා 02 |
| 3. | ප්‍රාදේශීය මාධ්‍යවේදී | Journalist-PJ | - අංක 03 |
| 4. | නිදහස් මාධ්‍යවේදී | Journalist (F/L) | - අංක 04 |
| 5. | මාධ්‍ය පරිපාලක | Media Administrator | - අංක 07 |
| 6. | මාධ්‍ය සේවා | Media Service | - අංක 01 හා 09 |

විද්‍යුත් මාධ්‍ය

| | | | |
|---|---|---|---|
| 1. | රූපවාහිනී මාධ්‍යවේදී | TV Journalist | - අංක 01 හා 02 |
| 2. | ගුවන්විදුලි මාධ්‍යවේදී | Radio Journalist | - අංක 01 හා 02 |
| 3. | රූපවාහිනී කැමරා මාධ්‍යවේදී | TV Camera Journalist | - අංක 01 හා 02 |
| 4. | සම්ප්‍රේෂක (නිවේදක) | Presenter | - අංක 01 හා 06 |
| 5. | මාධ්‍ය පරිපාලක | Media Administrator | - අංක 01 හා 07 |
| 6. | තාක්ෂණික ශිල්පී | Technical | - අංක 01 හා 08 |
| 7. | මාධ්‍ය සේවා | Media Service | - අංක 01 හා 09 |
| 8. | වෙබ් මාධ්‍යවේදී | Web Journalist | - අංක 10 |

රාජ්‍ය මාධ්‍ය නිලධාරීන්

| | | | |
|---|---|---|---|
| 1. | අමාත්‍යාංශ මාධ්‍ය නිලධාරි | Media Official | - අංක 05 |
| 2. | මාධ්‍ය සේවා | Media Service | - අංක 09 |

විදේශ මාධ්‍යවේදී

| | | | |
|---|---|---|---|
| 1. | විදේශීය මාධ්‍ය ආයතනයන්හි දේශීය නියෝජිතයන් | Foreign Media | - අංක 11 |
| 2. | තාවකාලිකව පැමිණෙන විදේශීය මාධ්‍යවේදීන් | Foreign Media (Temporary) | - අංක 11 |

**01. මූලික නිර්ණායක හා අවශ්‍ය ලිපි ලේඛන**

(i) පිළිගත් මාධ්‍ය ආයතනයක ස්ථිර හෝ කොන්ත්‍රාත් පදනම මත ජනමාධ්‍යවේදියකු ලෙස අවම වශයෙන් මාස 06 කට වැඩි කාලයක් සේවයේ නියුතු විය යුතු ය. (පුහුණුවීම් පදනමින් සේවය කරන්නන් හට මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකෙරේ.)

(ii) අදාළ මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය පහත දැක්වෙන ආකෘතියට අනුව සකස් කර මාධ්‍ය හැඳුනුම්පත ලබා දෙන ලෙස, රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගෙන් කරනු ලබන ඉල්ලීම් ලිපිය හා නාමලේඛනය ආයතනයේ ලිපි ශීර්ෂය යටතේ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරි/සාමාන්‍යාධිකාරි/ප්‍රධාන කර්තෘ/ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය නම, තනතුර, අත්සන සමඟ නිල මුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

| *අනු අංකය* | *නම* | *ජා.හැ.අංකය* | *තනතුර* | *සේවය කරන අංශය* |
|---|---|---|---|---|
| 01. | | | | |
| 02. | | | | |

(iii) නාම ලේඛනයේ සෑම පිටුවකම මාධ්‍ය හැඳුනුම්පත් ලබා දෙන ලෙස කරනු ලබන ඉල්ලීම් සහිත ලිපිය සහතික කරනු ලබන තැනැත්තා විසින් අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කළ යුතු ය.

(iv) නාමලේඛනයේ සඳහන් තනතුර තහවුරු කිරීම සඳහා මාධ්‍ය ආයතනය විසින් නිකුත් කරන ලද කාර්යාලයීය හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් නාමලේඛනය සහතික කරන තැනැත්තා විසින් නම, තනතුර සමඟ අත්සන හා නිල මුද්‍රාව තබා සත්‍ය පිටපතක් බවට සහතික කළ යුතු ය.

(v) කාර්යාලයීය හැඳුනුම්පත ඉදිරිපත් කළ නොහැකි අවස්ථාවක දී තම පත්වීම් ලිපියෙහි පිටපතක් නාමලේඛනය සහතික කරනු ලබන තැනැත්තා විසින් නම, තනතුර, අත්සන සමඟ නිල මුද්‍රාව තබා සහතික කළ යුතු ය.

(vi) රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dgi.gov.lk) හෝ රජයේ නිල පුවත් වෙබ් අඩවිය (www.news.lk) හෝ වෙතින් 2021 වර්ෂය සඳහා අදාළ අයදුම්පත් බාගත යුතු ය.

(vii) සමස්ත නාමලේඛනයට අමතරව, වෙන් වෙන් වශයෙන් සෑම අයදුම්පතක්ම අදාළ මාධ්‍ය ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී/ ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති කර්තෘ /ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ප්‍රවෘත්ති කළමනාකරු/ප්‍රධාන සංස්කාරක විසින් ස්වකීය අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කිරීම අනිවාර්යය වේ.

(viii) මාස 06 ක කාලයක් තුළ ලබාගත් අඟල් 1x1½ (සෙ.මී. 2.6 x සෙ.මී. 3.7) ප්‍රමාණයේ පැහැදිලි වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. එම ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ ඡායාරූප හා අපැහැදිලි ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබීම අනිවාර්යය වේ.

(ix) 2021 වසර තුළ නිකුත් කරනු ලබන මාධ්‍ය හැඳුනුම්පත්වල වලංගු කාලය 2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වේ.

**02. ආයතනගත / මාණ්ඩලික මාධ්‍යවේදී**

මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ ආයතනගතව සේවය කරන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා ඉහත අංක 01 හි (i) සිට (viii) දක්වා ඇති අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ය. පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනී, වෙබ් මාධ්‍යවේදීන් හා ඡායාරූප/වීඩියෝ කැමරා මාධ්‍යවේදීන් මෙම කාණ්ඩයට අයත් වේ.

**03. ප්‍රාදේශීය මාධ්‍යවේදී**

(i) 2020/2021 යන දෙවසර සඳහා, එනම් 2021 දෙසැම්බර් 31 දක්වා වලංගු වන පරිදි ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් දැනටමත් නිකුත්කර ඇති අතර, මේ දක්වා ඉල්ලුම් නොකළ හා එවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප වී ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු ය. අයදුම්පත්‍රය සමග ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය/වලංගු රියදුරු බලපත්‍රයේ පැහැදිලි ඡායාපිටපතක් එවිය යුතු වේ. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය අදාළ මාධ්‍ය ආයතනය විසින් දිස්ත්‍රික්ක මට්ටමෙන් වෙන් වෙන්ව පහත සඳහන් තොරතුරු සහිතව රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය.

- (අ) ප්‍රාදේශීය මාධ්‍යවේදියාගේ නම,
- (ආ) ජාතික හැඳුනුම්පත් අංකය,
- (ඇ) ස්ථිර ලිපිනය,
- (ඈ) වාර්තාකරු ආවරණය කරනු ලබන දිස්ත්‍රික්කය හා ප්‍රදේශය,
- (ඉ) මාධ්‍යවේදියාගේ දුරකථන අංකය.

(iii) තම ආයතනයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාමලේඛනය, මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා/ අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී/ සාමාන්‍යාධිකාරී/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රධාන ප්‍රවෘත්ති සංස්කාරක/ ප්‍රාදේශීය ප්‍රවෘත්ති සංස්කාරක විසින් නම, තනතුර, අත්සන හා නිල මුද්‍රාව සහිතව සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු ය. නාමලේඛනයේ සෑම පිටුවකම නාමලේඛනය සහතික කරනු ලබන තැනැත්තා විසින් තම අත්සන හා නිල මුද්‍රාව තබා සහතික කළ යුතු ය.

(iv) එම නාමලේඛනයේ මුල් පිටපත හා මෘදු පිටපත (Soft Copy) ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැළැස්විය යුතු ය. මෘදු පිටපත media.accre@gmail. com යන විද්‍යුත් තැපැල් ලිපිනය මගින් ලැබීමට සැළැස්විය යුතු ය.

(v) අයදුම්පත ඉදිරිපත් කරනු ලබන දිනට පෙර මාස 06 ක කාලයක් තුළ ලබා ගත් අඟල් 1x1½ (සෙ.මී. 2.6 x සෙ.මී. 3.7) ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය. එම ප්‍රමාණයට වඩා කුඩා ප්‍රමාණයේ හා අපැහැදිලි ඡායාරූප ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉන් එක් ඡායාරූපයක් අයදුම්පතෙහි අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබීම අනිවාර්යය වේ.

(vi) දැනට පුවත් සපයනු ලබන සක්‍රීය වාර්තාකරුවන්ගේ නම් පමණක් නාම ලේඛනයට ඇතුළත් කරන ලෙස මාධ්‍ය ආයතන ප්‍රධානීන්/ ප්‍රධාන කර්තෘ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය ප්‍රවෘත්ති කර්තෘවරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(vii) අදාළ අයදුම්පත් www.dgi.gov.lk හෝ www.news.lk යන වෙබ් අඩවිවලින් බාගත හැකි අතර, සම්පූර්ණ කරන ලද අයදුම්පත් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, අංක 163, කිරුළපන මාවත, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ගෙනවිත් භාරදීම සිදු කළ යුතු ය.

(viii) අයදුම්පත් එවනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ප්‍රාදේශීය මාධ්‍යවේදී හැඳුනුම්පත" යනුවෙන් සඳහන් කළ යුතු ය.

**04. නිදහස් මාධ්‍යවේදී**

අවම වශයෙන් වසරක කාලයක් අඛණ්ඩව නිදහස් මාධ්‍යවේදියකු ලෙස ජාතික මට්ටමින් පිළිගත් විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය ආයතනයක සේවය කර තිබිය යුතු අතර, ඒ බව තහවුරු කිරීමට පහත සඳහන් අවශ්‍යතා ඉදිරිපත් කළ යුතු ය:-

(i) අයදුම්පත ඉදිරිපත් කරන දිනට පෙර මාස හයක කාලයක් තුළ තමන් විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් පිළිබඳ පුවත්/ විශේෂාංග/ විචිත්‍රාංග/ ඡායාරූප ආදිය අවම වශයෙන් දොළහකට නොඅඩු සංඛ්‍යාවක සහතික කරන ලද ඡායා පිටපත් හෝ සංයුක්ත තැටි හෝ ඉදිරිපත් කළ යුතු ය.

(ii) ප්‍රවෘත්ති, විශේෂාංග ලිපි, කාලීන වැඩසටහන් සපයනු ලබන මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන වෙතින් අවම වශයෙන් එක් ආයතනයකින් හෝ තම මාධ්‍ය ආයතනය වෙත අඛණ්ඩව පුවත් හෝ වැඩසටහන් හෝ සපයන බවට එම ආයතනයේ ලිපි ශීර්ෂය සහිත ලිපියකින් ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත නිදහස් මාධ්‍යවේදී හැඳුනුම්පත ලබාදෙන ලෙස ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. එය මාධ්‍ය ආයතන ප්‍රධානීන්/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ /ප්‍රධාන සංස්කාරක විසින් නම, අත්සන සමඟ නිල මුද්‍රාව තබා සහතික කළ යුතු වේ.

**05. රාජ්‍ය මාධ්‍ය නිලධාරි**

(i) රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුලු රජයේ ව්‍යවස්ථාපිත ආයතනවල සෘජුවම මාධ්‍ය තනතුරු සඳහා නිල වශයෙන් පත්වීම් සහිත මාධ්‍ය ලේකම්/ මාධ්‍ය අධ්‍යක්ෂ/ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ/ ප්‍රවෘත්ති නිලධාරි/ මාධ්‍ය නිලධාරි /ඡායාරූප ශිල්පී/ වීඩියෝ කැමරා ශිල්පී/ මාධ්‍ය සහකාර යනාදී තනතුරු සඳහා ඊට අදාළ වර්ගීකරණයෙන් යුත් හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

(ii) අදාළ අමාත්‍යාංශයේ ලේකම් හෝ අතිරේක ලේකම් හෝ විසින් තම අමාත්‍යාංශයේ හෝ අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයේ මාධ්‍ය රාජකාරිවල නිරත වන ඉහත තනතුර දරන නිලධාරීන්ට හැඳුනුම්පත සඳහා අදාළ නම් සහ තනතුර සහතික කර රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කළ යුතු ය. අදාළ නාමලේඛනයේ පූර්ණ වගකීම එම ලේඛනය සහතික කරනු ලබන අමාත්‍යාංශ ලේකම්/ අතිරේක ලේකම් සතු වේ.

(iii) එම ඉල්ලීම් ලිපිය අදාළ රාජ්‍ය ආයතනයේ ආයතනික ලිපිගොනු අංකය සහිතව ඉදිරිපත් කළ යුතු අතර, එසේ නොමැතිව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ලිපි ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iv) රජයේ ආයතනයන්හි මාධ්‍ය ඒකකවල සේවය කළ ද ඉහත තනතුරු හැර වෙනත් තනතුරු දරන්නන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

(v) අමාත්‍යාංශයක් යටතේ පවතින අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත ආයතනයක මාධ්‍ය ඒකක සඳහා මාධ්‍ය හැඳුනුම්පත් ඉල්ලුම් කිරීමේ දී එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්/ සාමාන්‍යාධිකාරී විසින් නාමලේඛනය හා අයදුම්පත්‍රය නම, තනතුර හා නිල මුද්‍රාව සහිතව සහතික කළ යුතු ය.

**06. සම්ප්‍රේෂක (නිවේදක)**

(i) පිළිගත් ජනමාධ්‍ය ආයතනයක සේවයේ නියුතු ප්‍රවෘත්ති හා කාලීන මාධ්‍ය වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන නිවේදකයන් සඳහා සම්ප්‍රේෂක හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

(ii) ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා සම්ප්‍රේෂක හැඳුනුම්පත් සඳහා අයදුම් කරන අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු ය.

**07. මාධ්‍ය පරිපාලක**

(i) ජාතික මට්ටමින් පිළිගත් මාධ්‍ය ආයතනයක මාධ්‍ය පරිපාලනයට සෘජුවම දායකත්වය සපයන මාධ්‍ය පරිපාලකයන් සඳහා උපරිම වශයෙන් එක් මාධ්‍ය ආයතනයක තිදෙනකු සඳහා පමණක් මාධ්‍ය පරිපාලක හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

(ii) මාධ්‍ය ආයතනවල අලෙවි ප්‍රවර්ධන අධ්‍යක්ෂවරුන්/ කළමනාකරුවන්/ සුබසාධක නිලධාරීන් හෝ අලෙවි ප්‍රවර්ධන ක්ෂේත්‍රවල සේවය කරන වෙනත් නිලධාරීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

**08. මාධ්‍ය තාක්ෂණික ශිල්පී**

(i) ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ රාජකාරිවල සෘජුවම නිරතවන විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ තාක්ෂණික ශිල්පීන්ට තාක්ෂණික ශිල්පී හැඳුනුම්පත නිකුත් කෙරේ.

(ii) ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා මාධ්‍ය තාක්ෂණික ශිල්පී හැඳුනුම්පත් සඳහා අයදුම් කරන්නන් විසින් සම්පූර්ණ කළ යුතු ය.

**09. මාධ්‍ය සේවා**

(i) ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් අංශවල මාධ්‍ය කටයුතු සඳහා ආයතනයෙන් බැහැරව ක්ෂේත්‍ර මාධ්‍ය ආවරණ කටයුතු සඳහා සෘජුව සහායවන්නන් වෙනුවෙන් මාධ්‍ය සේවා හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

(ii) ඉහත අංක 01 යටතේ සඳහන් සියලු අවශ්‍යතා මාධ්‍ය සේවා හැඳුනුම්පත් සඳහා අයදුම්කරුවන් විසින් සම්පූර්ණ කළ යුතු ය.

**10. වෙබ් මාධ්‍යවේදී**

(i) ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා කරන වෙබ් අඩවිවල සේවයේ නියුතු මාධ්‍යවේදීන්ට පමණක් වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරෙනු ඇත.

(ii) වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීමේ දී අදාළ වෙබ් අඩවියේ භාවිතය, අරමුණු, ග්‍රාහක සංඛ්‍යාව (Numbers & hits) හා දිනපතා යාවත්කාලීන කිරීම යන කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත.

(iii) අදාළ වෙබ් අඩවිය 2020/ 2021 වසර වෙනුවෙන් ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලියාපදිංචි කර තිබිය යුතු අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ විෂයභාර මාණ්ඩලික නිලධාරියකු විසින් සහතික කළ එම ලියාපදිංචි සහතිකයේ පිටපතක් වෙබ් මාධ්‍යවේදී අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වුව ද ජනමාධ්‍ය විෂයභාර අමාත්‍යාංශයෙන් වෙබ් අඩවි ලියාපදිංචි සහතිකය ලබා තිබීම පමණක් මාධ්‍ය හැඳුනුම්පතක් ලබාගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සපුරාලීමක් නොවනු ඇත.

(iv) මාධ්‍ය හැඳුනුම්පත් සඳහා ඉල්ලුම් කරනු ලබන සෑම ප්‍රවෘත්ති වෙබ් අඩවියක්ම මාධ්‍ය ආයතනයක් ලෙස ව්‍යාපාර ලියාපදිංචිය (Business Registration) ලබා තිබිය යුතු අතර, එම ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතු ය. ව්‍යාපාරය ලියාපදිංචි කරනු ලබන ආයතනයේ මාණ්ඩලික නිලධාරියකු විසින් ස්වකීය නම, අත්සන හා නිල මුද්‍රාව සහිතව එය සහතික කළ යුතු වේ.

(v) වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් ලබා ගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යම් අයදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කරගැනීම අවශ්‍ය බවට හැඟීයන අවස්ථාවන් හි දී, එම අයදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, අවශ්‍ය වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව තීරණය කෙරෙනු ඇත.

(vi) මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අවම වශයෙන් මාස හයක කාලයක්, දෛනිකව හා අඛණ්ඩව යාවත්කාලීන කරනු ලැබූ වෙබ් අඩවියක් විය යුතු අතර, එම වෙබ් අඩවිවල පළකෙරෙන වාර්තා අතුරින් අවම වශයෙන් 35%ක ප්‍රමාණයක් ප්‍රවෘත්ති හා කාලීන තොරතුරු අන්තර්ගත වීම අනිවාර්යය වේ. මාධ්‍ය හැඳුනුම්පත් අපේක්ෂිත යම් වෙබ් අඩවියක අවම වශයෙන් සතියකට ප්‍රවෘත්ති 30ක් වත් පළවිය යුතු ය.

(vii) එක් භාෂා මාධ්‍යයක් වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් 02ක උපරිමයකට යටත්ව වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

(viii) එක් පුද්ගලයකු හෝ සමාගමක් යටතේ වෙබ් අඩවි කිහිපයක් ලියාපදිංචි කර තිබෙන අවස්ථාවල දී ඉන් එක් වෙබ් අඩවියක් සඳහා පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කෙරේ.

(ix) වෙබ් මාධ්‍යකරණයෙහි යෙදී සිටින ජනමාධ්‍යවේදීන්ට පමණක් මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරන අතර, වෙබ් සභාපති/ වෙබ් අඩවි පාලක/ ගවනර්/ පරිපාලන අධ්‍යක්ෂ ආදී මාධ්‍යවේදීන්ට පරිබාහිර තනතුරු සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

(x) වෙබ් මාධ්‍ය හැඳුනුම්පතක් නිකුත් කරනුයේ සෘජුවම ප්‍රවෘත්ති වෙබ් අඩවි සඳහා පමණක් වන අතර, වෙනත් ආයතනික වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

11. විදේශ මාධ්‍ය

- ස්ථිර

(i) ජාත්‍යන්තරව පිළිගත් විදේශ මාධ්‍ය ආයතනවල ශ්‍රී ලංකාවේ නියෝජිතයන්/වාර්තාකරුවන් ලෙස එම ආයතන විසින් පත්කරනු ලැබ, ස්ථිර වශයෙන්ම අදාළ මාධ්‍ය ආයතනයේ සේවය කරනු ලබන මාණ්ඩලික මාධ්‍යවේදීන් සඳහා පමණක් විදේශ මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කරනු ලැබේ.

(ii) මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ අයදුම්කරු විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අදාළ විදේශ මාධ්‍ය ආයතනය වෙතින් තවදුරටත් තහවුරු කර ගැනීමෙන් අනතුරුවය.

*අවශ්‍ය ලිපි ලේඛන:*

(i) අයදුම්කරු තම මාධ්‍ය ආයතනයේ සේවය කරන බවට අදාළ විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රයෙහි / ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.

(iii) මාස 06 ක කාලයක් තුළ ලබාගත් අඟල් 1x 1½ (සෙ.මී. 2.6 x සෙ. මී. 3.7) ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අතර ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබිය යුතු ය.

(iv) විදේශ මාධ්‍ය හැඳුනුම්පත් ලබාගැනීම වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන යම් අයදුම්පතක් සම්බන්ධව තවදුරටත් තොරතුරු තහවුරු කරගැනීම අවශ්‍ය බවට හැඟීයන අවස්ථාවන්හි දී, එම අයදුම්පත් අදාළ අංශ වෙත යොමුකර, අවශ්‍ය වාර්තා ලබාගැනීමෙන් අනතුරුව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳව තීරණය කෙරෙනු ඇත.

- තාවකාලික

ප්‍රවෘත්ති හා කාලීන වැදගත්කමක් ඇති විශේෂ අවස්ථා ආවරණය කිරීම සහ ප්‍රවෘත්තිමය වටිනාකමකින් යුත් වාර්තාමය වැඩ සටහන් නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකාවට පැමිණෙන විදේශ මාධ්‍යවේදීන් සඳහා තාවකාලික මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

*අවශ්‍ය ලිපි ලේඛන:*

(i) අයදුම්කරු තම මාධ්‍ය ආයතනයේ සේවය කරන බවට අදාළ විදේශ මාධ්‍ය ආයතනයේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවා සහතිකය.

(ii) විදේශ කටයුතු අමාත්‍යාංශයේ අනුමත ලිපිය.

(iii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

(iv) මාස 06 ක කාලයක් තුළ ලබාගත් අඟල් 1x 1½ (සෙ.මී. 2.6 x සෙ.මී 3.7) ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක් ඉල්ලුම් පත්‍රය සමඟ ඉදිරිපත් කළ යුතු අතර, ඉන් එක් ඡායාරූපයක් අයදුම්පත්‍රයේ අදාළ ස්ථානයේ නොගැළවෙන ලෙස අලවා තිබිය යුතු ය.

(v) විදේශ ගමන් බලපත්‍රයේ ඡායාරූපය මේ සඳහා යොදාගනු නොලැබේ.

**පොදු කොන්දේසි:**

01. 2021 වසර වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා අයදුම්පත් භාරගැනීම 2021 පෙබරවාරි මස 28 වැනි දිනෙන් අවසන් කෙරේ. එදිනට පසුව භාර දෙන අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

02. මාසික වාර ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 3 ක් හා ද්වි මාසික වාර ප්‍රකාශන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් උපරිමය 2 ක් නිකුත් කරනු ලැබේ.

03. ත්‍රෛමාසික, සය මාසික හෝ වාර්ෂික වාර සඟරා/ ප්‍රකාශන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

04. අදාළ සඟරාව / ප්‍රකාශනය අඛණ්ඩව ප්‍රකාශයට පත්කරන බව තහවුරු කරනු පිණිස මෑතක දී පිළිවෙළින් පළකරන ලද එම ප්‍රකාශනයේ මාස 06ක පිටපත් සහ ජාතික ලේඛණාරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කළ යුතු වේ.

05. සෑම සඟරාවක් /ප්‍රකාශනයක් සඳහාම ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතු ය.

06. යම් කිසි පුවත්පතක් සමඟ නිකුත් කරනු ලබන අතිරේක, වෙනම පුවත්පතක් ලෙස නොසැලකෙන අතර, එම අතිරේක වෙනුවෙන් හැඳුනුම්පත් අයදුම් කරන මාධ්‍යවේදීන් වෙත අදාළ ප්‍රධාන පුවත්පත නමින් පමණක් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ.

07. මාධ්‍ය ආයතනයක සේවයෙන් ඉවත්කරන/ඉවත්ව යනු ලබන මාධ්‍යවේදියකුගේ හැඳුනුම්පත නැවත ලබාගෙන රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කිරීම මාධ්‍ය ආයතන ප්‍රධානියාගේ වගකීම වනු ඇත. එසේ නැවත භාර දීමකින් තොරව ඒ වෙනුවට වෙනත් තැනැත්තකු වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ:

එසේම එම මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත භාර නොදී අදාළ මාධ්‍යවේදියා/ වෘත්තිකයා වෙනත් මාධ්‍ය ආයතනයකින් හැඳුනුම්පතක් සඳහා අයදුම් කළ ද නව හැඳුනුම්පතක් නිකුත් කරනු නොලැබේ.

08. සිනමා/ටෙලිනාට්‍ය/ වේදිකා නාට්‍ය වැනි ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රවල නියුතු ශිල්පීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

09. ප්‍රචාරක හා දැන්වීම් ආයතන හා වීඩියෝ නිෂ්පාදන ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

10. අස්ථානගත වූ මාධ්‍ය හැඳුනුම්පතක් වෙනුවට නැවත හැඳුනුම්පතක් ලබා ගැනීමේ දී එම අස්ථානගත වීම පිළිබඳව පොලිසියේ පැමිණිලි කිරීමෙන් අනතුරුව අදාළ පොලිස් ස්ථානය විසින් නිකුත් කරනු ලබන පොලිස් වාර්තාවේ සහතික කරන ලද මුල් පිටපත සමඟ සේවය කරන ආයතනය මගින් මාධ්‍ය හැඳුනුම්පතක් නැවත ලබාදෙන ලෙස රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත ඉල්ලීමක් කළ යුතු ය.

11. අන්වර්ථ නාම යටතේ ප්‍රවෘත්ති/ විශේෂාංග/ වැඩසටහන් ඉදිරිපත් කරනු ලබන ජනමාධ්‍යවේදීන් සඳහා එම අන්වර්ථ නාමයන්ගෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

12. ප්‍රවෘත්ති හා කාලීන සිදුවීම් වාර්තා නොකරන මාධ්‍ය ආයතන සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

13. විවිධ විෂයය ක්ෂේත්‍ර සඳහා පළ කෙරෙන අත්පොත් (Guide Books) හෝ ප්‍රවෘත්ති හා කාලීන තොරතුරුවලින් බැහැර ප්‍රකාශන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

14. මෙම මාධ්‍ය හැඳුනුම්පත මාධ්‍ය රාජකාරි කටයුතු සඳහා පමණක් භාවිත කළ යුතු ය. යම් හෙයකින් එය අවභාවිත කිරීම හෝ ජනමාධ්‍ය ආචාර ධර්මවලට පටහැනිව කටයුතු කිරීම් වැනි අවස්ථා වාර්තා වුවහොත් මාධ්‍ය හැඳුනුම්පත අවලංගු කිරීමේ හෝ එම මාධ්‍ය හැඳුනුම්පත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදෙන ලෙස නියෝග කිරීමේ බලය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් සතු වේ.

15. ආයතනගත/ මාණ්ඩලික ජනමාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනුයේ වසරකට එක් වරක් පමණි. අදාළ ආයතන විසින් වරින්වර ඒ පිළිබඳව කරනු ලබන ඉල්ලීම් සලකා නොබලන අතර, එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

16. කළමනාකරණ සේවා නිලධාරි / සම්බන්ධීකාරක වැනි සෘජුවම මාධ්‍යකරණයට අදාළ නොවන තනතුරු දරන්නන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු නොලැබේ.

17. ගෞරව නාම හා අධ්‍යාපන සුදුසුකම් සහිත නාම මාධ්‍ය හැඳුනුම්පතෙහි සඳහන් නොකරන අතර හැඳුනුම්පතෙහි සඳහන් කරනුයේ මාධ්‍යවේදියාගේ නම සහ අදාළ තොරතුරු පමණි.

18. රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය අනුබද්ධිත ආයතන ඇතුළු සියලුම රජයේ ආයතනවල ආයතනික වෙබ් අඩවි සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් නොකරනු ලැබේ.

19. කේබල් රූපවාහිනී ආයතන වෙනුවෙන් මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සලකා බැලීම සඳහා එම රූපවාහිනී නාලිකාව ඔස්සේ අවම වශයෙන් සතියකට ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් 05 ක් හෝ විකාශය වී තිබිය යුතුය. එම අවශ්‍යතාව සපුරා ඇති කේබල් රූපවාහිනී ආයතනයන් හි ප්‍රවෘත්ති අංශය සඳහා පමණක් එක් භාෂා මාධ්‍යයක් සඳහා හැඳුනුම්පත් 02 ක් බැගින් වන පරිදි උපරිමය 06 කට යටත්ව මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කරනු ලැබේ. මෙම මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ලියාපදිංචි කේබල් රූපවාහිනී සේවා සඳහා ලබා දෙන බලපත්‍රයන්හි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතු ය.

20. මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම පිළිබඳ අවසාන තීරණය රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන අතර, ඉහත කොන්දේසි හා අවශ්‍යතා කාලීන වශයෙන් වෙනස් කරලීමේ බලය ද රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

21. පෞද්ගලික අභිමතාර්ථ සාක්ෂාත් කරගැනීමේ අරමුණින් මුද්‍රිත, විද්‍යුත්, හෝ වෙබ් මාධ්‍ය හැඳුනුම්පත් භාවිත කිරීම පිළිබඳ පැමිණිලි ලදහොත් ඒ පිළිබඳ විමර්ශනය කර අදාළ මාධ්‍යවේදීන්ගේ මාධ්‍ය හැඳුනුම්පත අවලංගු කිරීමේ පූර්ණ බලය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වේ.

**නාලක කලුවැව,**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්.

2020 දෙසැම්බර් මස 08 වැනි දින,
කොළඹ 05,
කිරුළපන ඇවනිව් හි,
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.